**ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව - 2017**

-----------------------------------------------

ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතේ 9 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. කමිටුවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණ කමිටුවේ වගකීම**

-----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කමිටුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කමිටුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ 2වන පරිච්ඡේදයේ 2.52 ඡේදය ප්‍රකාරව ප්‍රමිති වලින් අවසර දී ඇති විටෙක හැර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් විකිණීමේ අලාභ රු.305,406 ක් අනෙකුත් ආදායම් වලට හිලව් කර දක්වා තිබුණි.

(ආ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ 28 පරිච්ඡේදයේ 28.15 ඡේදය ප්‍රකාරව පාරිතෝෂික වෙන්කිරීම් වගකීමෙහි වර්තමාන වටිනාකම හඳුනාගෙන නොතිබුණු අතර කමිටුවේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සේවයේ ආරම්භක දිනයේ සිට එක් එක් වර්ෂය සඳහා මාස භාගයක වැටුප පදනම්ව රු.1,635,112 ක් වූ පාරිතෝෂික වෙන්කිරීම්, වගකීම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආසියානු ඔලිම්පික් කමිටුවෙන් ලද රු.3,093,635 ක් වූ පරිත්‍යාග මුදලින් මිලදී ගත් ස්ථාවර වත්කම් ක්ෂය නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් ක්ෂය රු.593,918 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව 2005 වර්ෂයේදී ජාතික ඔලිම්පික් කමිටු ප්‍රධාන කාර්යාලය වෙත පවරන ලද රූඩ් 01 පර්චස් 20 ක් වූ ඉඩම තක්සේරු කර එහි වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වෙන්කිරීම රු.204,600 කින් අඩුවෙන් දැක්වීම හේතුවෙන් ආදායම් බදු වියදම සහ උපචිත ආදායම් බදු එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු රු.6,878,916 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂය රු.2,110,949 ක් වූ අතර එය අමාත්‍යාංශයේ ගිණුම් අනුව රු.926,554 ක් වුයෙන් රු.1,184,395 ක වෙනසක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ශේෂය රු.640,906 ක් වූ අතර එය දෙපාර්තමේන්තුවේ ගිණුම් අනුව රු.9,614,817 ක් වූයෙන් රු.8,973,911 ක වෙනසක් විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියේ දැක්වෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

| | ගිණුම් විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා පැසිපන්දු සම්මේලනය සඳහා කණ්ඩායම් උපකාර ප්‍රදාන ව්‍යාපෘතිය | | |
| | (i) පැසිපන්දු මිලදී ගැනීම. | 68,000 | බිල්පත් |
| | (ii) කෑම සහ වතුර මිලදී ගැනීමේ වියදම් | 102,000 | බිල්පත් |
| | (iii) නවාතැන් සහ කෑම වියදම් | 831,000 | බිල්පත් |
| | (iv) පුහුණුකරුවන් සඳහා ගෙවීම් | 220,000 | මුදල් ලබා ගත් බවට සනාථවන අත්සන් ලේඛන |
| (ආ) | ශ්‍රී ලංකා වොලිබොල් සම්මේලනයේ පුහුණුකරුවන්ගේ ව්‍යාපෘතියට ලබා දුන් මුදල් | 264,096 | මුදල් ලැබූ බවට සංගමය විසින් නිකුත් කළ ලදු පත |
| (ඇ) | වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ | 352,611 | ශේෂ සනාථන ලිපි |
| (ඈ) | වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ | 189,165 | ශේෂ සනථන ලිපි |
| (ඉ) | දේපළ පිරියත හා උපකරණ | 174,775,158 | වාර්ෂික සමීක්ෂණ වාර්තා |
| (ඊ) | ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවෙන්, ආසියානු ඔලිම්පික් කමිටුවෙන් සහ අනෙකුත් ආයතන වලින් ලද ප්‍රදාන | 69,447,310 | ප්‍රදානයන් පිළිබඳ තහවුරු කිරීම් ලිපි සහ රු. 168,079 ක් සඳහා බැංකු බැර නිවේදන |

**2.3 ලැබිය යුතු ගිණුම් ශේෂ**

බාහිර පෞද්ගලික ආයතනයකින් අයකර ගත යුතු රු.173,603 ක් වර්ෂ 6 ක කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 ඡේද ප්‍රකාරව කමිටුව විසින් 2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය ප්‍රතිඵලය රු.664,763 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,740,138 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,404,901 ක පිරිහීමක් පෙන්නුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ වියදම රු.88,743,722 කින් අඩුවී තිබුණද ආදායම රු.93,148,623 කින් අඩුවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

**(අ) නියෝග ප්‍රකාර ක්‍රියා නොකිරීම**

ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව 1937 අප්‍රේල් 08 දින ස්ථාපිත කරන ලද අතර එම වර්ෂයේදීම ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවේ සාමාජිකත්වය ලබා ගන්නා ලදී. 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 18 වන වගන්තියේ සිට 21 වන වගන්තිය දක්වා වගන්ති මගින් කමිටුවේ නෛතික ක්‍රියාකාරිත්වයට අදාළව විධිවිධාන සකස් කර පසුව එම විධිවිධාන අවස්ථා දෙකකදී සංශෝධනය කර තිබුණි. 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 19 වන වගන්තිය සමඟ කියවියයුතු පනතේ 41 වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද ජාතික ඔලිම්පික් කමිටුව සම්බන්ධයෙන් නියෝග හා එහි සංශෝධිත නියෝග පනවා තිබුණි. අංක 8 (අ) නියෝගයට අනුව, දේශීය හෝ විදේශීය මාර්ගවලින් කමිටුව වෙත ලැබුණු සියළු මුදල්, උපකරණ හා වෙනත් සම්පත් පිළිබඳ ත්‍රෛයිමාසික වාර්තා සහ 8 (ආ) නියෝගයට අනුව එක් එක් ත්‍රෛමාසයක් තුළ කමිටුව විසින් ඉටුකරන ලද කටයුතු සම්බන්ධ වාර්තා අමාත්‍යවරයා වෙත සැපයිය යුතු වුවද එකී නියෝගය අනුව කටයුතු කර ඇති බවට තොරතුරු විගණනයේ දී තහවුරු නොවුණි.

මේ සම්බන්ධයෙන් 2019 පෙබරවාරි 20 දින ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ මහලේකම් විසින් ක්‍රීඩා පනත හා ජාතික ඔලිම්පික් කමිටුවේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් නීතිපතිගේ අදහස් විමසා තිබූ බවට විගණනයට කරුණු දක්වා තිබුණි.

**(ආ) ක්‍රීඩා සංගම් සඳහා මුදල් ලබා දීම**

(i) ක්‍රීඩා සංගමයේ ලිපි ශිර්ෂ වලින් අරමුදල් ඉල්ලුම් කර නොතිබීම, ජාත්‍යන්තර සාමාජික ගාස්තු ගෙවූ බවට තහවුරුවක් ඉදිරිපත් නොකිරීම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, පසුගිය වර්ෂයේ විගණනය කරන ලද ගිණුම් හා පසුගිය වර්ෂයේ කාර්යසාධන වාර්තා ඉදිරිපත් නොකිරීම යන හේතූන් මත සමාලෝචිත වර්ෂය තුළදී ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවෙන් සාමාජික සංගම් අතර බෙදා දීම සඳහා කමිටුව වෙත ලබා දී තිබුණු එකතුව රු.3,297,111 ක් වූ අරමුදල් ජාතික ක්‍රීඩා සංගම් 15 ක් වෙත බෙදා හැර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා හොකී සම්මේලනයේ 2015 සහ 2016 වර්ෂවල හොකි තරඟාවලි පැවැත්වීම සඳහා ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව විසින් ඇමරිකානු ඩොලර් 18,300 ක් (රු.2,421,830) අත්තිකාරම් වශයෙන් ජාතික ඔලිම්පික් කමිටුව වෙත ලබා දී තිබුණි. ශ්‍රී ලංකා හොකී සම්මේලනයේ නිලවරණය නොපැවැත්වීම හේතුවෙන් එම සම්මේලනයේ කටයුතු ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් යටතට පත්කර තිබුණු අතර සම්මේලනයේ කටයුතු අතුරු පාලක කමිටුව මගින් ක්‍රියාත්මත වන බැවින් මෙම ආධාර හොකී සම්මේලනය වෙත ලබා දී නොතිබුණි. හොකී තරඟාවලි පැවැත්වීම සඳහා ලබාදී නොතිබුණු අරමුදල් පිළිබඳව කමිටුව විසින් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කමිටුව විසින් නිකුත් කරන ලද සේවක ණය සම්බන්ධ නීති හා රෙගුලාසි මාලාව කමිටුවේ විධායක කමිටුව විසින් අනුමත කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී සේවයෙන් ඉවත් වූ කමිටුවේ නිලධාරීන් 03 දෙනෙකු ගෙන් අයවිය යුතු සේවක ණය රු.692,860 ක් හා ඒ සඳහා වූ පොලිය රු.43,874 ක් 2018 දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් තොරව හා විධායක කමිටුවේ අනුමැතිය නොමැතිව සහ දේශීය වශයෙන් මිලදී ගැනීමේ හැකියාවක් තිබේද යන්න සොයා බැලීමකින් තොරව ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දත්ත එකතු කිරීම හා තොරතුරු සම්පාදනය සඳහා ඇමරිකාවේ නිව්යෝර්ක්හී උපදේශක ආයතනයකින් ඇමරිකානු ඩොලර් 30,000 කට මෘදුකාංගයක් මිලදී ගැනීම සඳහා 2014 නොවැම්බර් 14 දින ගිවිසුම් ගත වී තිබුණි. මේ සඳහා ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවෙන් ලැබී තිබුණු ඇමරිකානු ඩොලර් 30,000 කින් 2015 වර්ෂයේදී ඩොලර් 22,500 ක් සහ සමාලෝචිත වර්ෂයේදී ඩොලර් 7,500 ක් උපදේශක ආයතනයට ගෙවා තිබුණි. මෘදුකාංගයේ නඩත්තු හා සේවා කටයුතු, මෘදුකාංගය ස්ථාපිත කර පවත්වා ගෙන යනු ලබන ආයතනය, ඉදිරියේදී මෘදුකාංගයේ සිදුවිය හැකි වෙනස් කිරීම්, මෘදුකාංග සැපයුම් ආයතනය වසා දැමීමකදී පහසුකම් ලබා ගැනීම යනාදී කරුණු ඔලිම්පික් කමිටුව සහ සේවා සැපයුම්කරු සමඟ එළඹී මිලදී ගැනීමේ ගිවිසුමේ ඇතුළත් කර නොතිබුණි. 2017-2018 කාලයට අදාළව ගිවිසුමට අදාළ නොමැති වාර්ෂික නඩත්තු හා යාවත්කාලීන කටයුතු සඳහා ඇමරිකානු ඩොලර් 7,500 ක් අයවිය යුතු බවට උපදේශක ආයතනය විසින් 2018 අප්‍රේල් 04 දින ජාතික ඔලිම්පික් කමිටුව වෙත දන්වා තිබුණි. මෙම ගාස්තු නොගෙවීම නිසා උපදේශක ආයතනය විසින් 2018 අගෝස්තු 14 දින සිට මෘදුකාංගය අක්‍රීය කර තිබුණි. තවද මෙම කාල සීමාව තුළ සියලුම ක්‍රීඩකයින්ගේ දත්ත එකතු කර තොරතුරු සම්පාදනය කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව තෝරාගත් බදුකරුවෙකු වෙත කමිටුවට අයත් භෝජනාගාරය 2016 නොවැම්බර් 01 දින සිට වර්ෂ 5 ක් සඳහා පුද්ගලික සමාගමකට බදු දී තිබුණු අතර බදු ගිවිසුම අනුව බදු මුදල් වශයෙන් මුල් වර්ෂ තුන සඳහා මාසිකව රු.360,000 ක්, 4 වන වර්ෂය සඳහා රු.375,000 ක් හා 5 වන වර්ෂය සඳහා රු.390,000 ක් බදුකරු විසින් මාසිකව ගෙවිය යුතුව තිබුණි. බදුකරු සමග 2017 ජනවාරි 27 දින එළඹ තිබුණු බදු ගිවිසුම ලියාපදිංචිය සඳහා 2017 පෙබරවාරි 08 දින ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය වෙත යොමු කර තිබුණද 2017 අප්‍රේල් 12 දින එම බදු ගිවිසුම ලියාපදිංචි කිරීම ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. කමිටුව විසින් ලබා ගෙන තිබුණු මත්පැන් විකිණීමේ බලපත්‍රය භෝජනාගාරය සඳහා ලබා දී තිබුණු අතර එම බලපත්‍රය අලුත් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.998,500 ක් හා බලපත්‍රය අත්හිටුවීම/ අවලංගු කිරීමේ නිවේදනය වෙනුවෙන් සමථ ගාස්තු ලෙස 2016 සහ 2018 වර්ෂවල රු.133,200 ක් බදුකරුගෙන් ලබාගෙන සුරාබදු දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණි. මෙම ගෙවීම් කමිටුවේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ඇ) කමිටුව විසින් බදු දී ඇති භෝජනාගාරය හා කායවර්ධන මධ්‍යස්ථානය ඇතුළු මුළු ගොඩනැගිල්ල සඳහා එක් විදුලි මීටරයකින් විදුලිය ලබා ගෙන තිබුණු අතර ඒ සඳහා වෙන් වෙන් වශයෙන් විදුලි මීටර් සවිකර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ රු.4,412,446 ක් වූ විදුලි වියදම මෙම අංශ 3 අතර බෙදා වෙන් කර තිබුණද එම වියදම් ගණනය කිරීමේ උපලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) වාර්ෂික සමීක්ෂණ මණ්ඩලයකින් අපහරණය කිරීමට නිර්දේශ ලබාගෙන නොතිබුණු හා විධිමත් තක්සේරු වාර්තාවක් ලබාගෙන නොතිබුණු පිරිවැය රු.10,519,450 ක් වූ සම්පූර්ණයෙන් ක්‍ෂය කරන ලද කාය වර්ධන උපකරණ 13 ක් 2016 වර්ෂයේ කමිටුවට අයත් කාය වර්ධන මධ්‍යස්ථානය පුද්ගලික ආයතනය වෙත බදු දී තිබුණි. මේ සඳහා වර්ෂයක කාල පමාවකින් පසු අදාළ ආයතනය විසින් කමිටුව වෙත රු.300,000 ක් පමණක් ලබා දී තිබුණි. මේ හේතුවෙන් අදාළ උපකරණ අපහරණය කිරීමෙන් කමිටුවට ලබා ගැනීමට හැකි වී තිබුණු වාසිදායක තත්ත්වය මඟහැරී ගොස් තිබුණි. මීට අමතරව කමිටුවට අයත් සම්පූර්ණයෙන් ක්‍ෂය කරන ලද වර්ෂ 09 ක් පැරණි පිරිවැය රු. 9,898,727ක් වූ කාය වර්ධන උපකරණ 26 ක් කිසිඳු අය කිරීමකින් තොරව කාය වර්ධන මධ්‍යස්ථානය පවත්වා ගෙන යනු ලබන පුද්ගලික ආයතනයේ පරිහරණය සඳහා ලබා දී තිබුණි.

(ඊ) ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවේ වාර්තාවකට අනුව (Olympic Games Subsidies) 2016 වර්ෂයේ පවත්වන ලද රියෝ ඔලිම්පික් උළෙලට සහභාගි වීම සඳහා කමිටුවේ සභාපති හා ප්‍රධාන ලේකම් වෙත ගමන් වියදම් හා නවාතැන් වියදම් සඳහා ඇමරිකානු ඩොලර් 10,000 (ශ්‍රී ලංකා රුපියල් 1,425,159) බැගින් එම මුදල් නිලධාරීන් වෙත 2016 මාර්තු 14 දින ගෙවා තිබියදී සභාපති වෙනුවෙන් රු.791,690 ක් හා ප්‍රධාන ලේකම් වෙනුවෙන් රු.1,064,018 ක් කමිටුව විසින් 2016 වර්ෂය තුළ වැය කර තිබුණි. පසුව නිලධාරීන් මුලින් ලබා ගත් මුදල් වර්ෂයකට අධික කාලයක් රඳවා ගෙන 2017 අප්‍රේල් 06 හා 2017 දෙසැම්බර් 04 දින නැවත කමිටුව වෙත ගෙවා තිබුණි.

**4.3** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2013 වර්ෂය තුළ ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටුවේ 75 වන සංවත්සරයට සමගාමීව රු.5,200,000 කට “සමරු පොත්” 2000 ක් මුද්‍රණය කර සැපයීමේ කාර්යය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව පුද්ගලික ආයතනයක් තෝරා ගෙන ගිවිසුමකට එළඹීමකින් තොරව කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. එම කාර්ය සඳහා 2013 සැප්තැම්බර් 30 දින කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 50 ක් වූ රු. 2,600,000 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. පසුගිය විගණකාධිපති වාර්තා මගින් මෙම කාරණය පෙන්වා දී තිබුණද 2018 නොවැම්බර් 30 දින වනවිටත් එම කාර්යය ඉටුකර ගැනීමට හෝ අත්තිකාරම් මුදල කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. “මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටුව 2019 වර්ෂයේ පවත්වනු ලබන 80 වැනි සංවත්සරයට අදාළව සමරු පොත් මුද්‍රණයේදී මෙම අත්තිකාරම් මුදල හිලව් කිරීමට බලාපොරොත්තු වන බව කමිටුවේ භාණ්ඩාගාරික විසින් විගණනය වෙත දන්වා තිබුණි.”

(ආ) කණ්ඩායම් උපකාර ප්‍රදාන ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා පැසිපන්දු සම්මේලනය විසින් පුද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණු රු.153,450 ක් වූ ඇඳුම් සඳහා කමිටුව වෙත ඉදිරිපත් කර තිබූ එම පුද්ගලික ආයතනයෙන් නිකුත් කරන ලද ඉන්වොයිස්පත් 3 ක් සඳහා යොදා තිබුණු අත්සන් එකිනෙකට වෙනස් බව නිරීක්ෂණය විය. මේ සඳහා ගෙවීම් සිදු කළ බව සනාථවන බිල්පත්ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) බඳවා ගැනීමේ පරිපාටිය**

ඔලිම්පික් කමිටුවේ කාර්ය මණ්ඩලය සඳහා විධායක කමිටුව විසින් අනුමත කරන ලද විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කර නොතිබුණි.

**(ආ) අනුමත කාර්ය මණ්ඩලය**

(i) කමිටුවේ කාර්ය මණ්ඩලය විධායක කමිටුව විසින් අනුමත කර නොතිබුණි.

(ii) ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, මූල්‍ය හා පරිපාලන කළමනාකරු, ජාත්‍යන්තර වැඩසටහන් කළමනාකරු, මෙහෙයුම් කළමනාකරු යනාදී ප්‍රධාන තනතුරු ඇතුළු තනතුරු 07 ක් වර්ෂ 02 කට වඩා වැඩි කාලයක් සිට පුරප්පාඩුවී පැවතුණි.

**4.5 හඳුනාගත් පාඩු**

කමිටුව විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට නිසි පරිදි දායක මුදල් ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් අවස්ථා 3 කදී රු.3,154 ක් අධිභාර ගෙවා තිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

මූල්‍ය හා භෞතික ඉලක්කයන් කාලීනව ඉටුකර ගැනීම තහවුරු වීමට සහ වෙන් කරන ලද අරමුදල් ඵලදායි උපයෝජනය වැඩිකර ගැනීම සඳහා වර්ෂය අවසානයේ වගකීම් දක්වමින් අයවැය පදනම් කරගෙන ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.2 සංයුක්ත සැලැස්ම**

කමිටුවේ අනාගත දිශාව තීරණය කරනු ලබන උපක්‍රම වලින් සංයුක්ත සැලැස්ම සමන්විත විය යුතු අතර සත්‍ය කාර්ය සාධනය ස්ථාවර ඉලක්ක වෙත දිශා ගත වීම සඳහා යථාවාදී හා ළඟා කර ගත හැකි ඉලක්ක ඇතුළත් කර සංයුක්ත සැලැස්මක් කමිටුව විසින් පිළියෙල කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

කමිටුවේ කටයුතු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු කමිටුවේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ආදායම් වලට වියදම් හිලව්කර ගිණුම්ගත කර තිබීම. |
| | | (ii) | ස්ථාවර වත්කම් ගිණුම්ගත නොකිරීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | (i) | බඳවා ගැනීමේ පරිපාටියක් අනුමත කර ගෙන නොතිබීම. |
| | | (ii) | පුරප්පාඩු පිරවීමට ක්‍රියාකර නොතිබීම. |
| (ඇ) | මූල්‍ය පාලනය | (i) | ව්‍යාපෘති සඳහා ක්‍රීඩා සංගම් වෙත ලබා දුන් මුදල් වැය කිරීම් ප්‍රමාණවත් පරිදි අධීක්ෂණය නොකිරීම. |
| | | (ii) | හිඟ සේවක ණය අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ඉ) | ප්‍රසම්පාදන පාලනය | | කමිටුව විසින් මිලදී ගැනීම් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කර නොතිබුණි. |